# Living the LOTUS

## Buddhism in Everyday Life

2
2019
VOL. 161

Founder's Essay

## අවංකත්වයෙන් පරිපූර්ණව

හදවතින්ම විශ්වාස කළ හැකි එක් පුද්ගලයෙක්ව හෝ ඇති කර ගන්නේ නම්, සාර්ථකත්වයෙන් පිරි ජීවිතයක් ගත කිරීමට හැකිවනවා නොවේද. අපගේ ශ්‍රද්ධාවත් පැවතිය යුතු වන්නේ ඒ වෙනුවෙන් යැයි සිතමි. බුදුන් වහන්සේ සෑම දෙයක්ම බලාගෙන සිටිනවා යැයි විශ්වාස කිරීම, ශ්‍රද්ධාව තුලින් අපට ලැබෙන මහගු ආනිශංසයකි.

සාමාන්‍ය ලෝකයේ අන් අය ගැන විශ්වාසයක් නොමැතිව හොරෙන්, නොපෙනෙන ආකාරයට කටයුතු කිරීමට උත්සහ කරන පිරිස්ද සිටියි. නමුත් හදවතින්ම බුදුන් වහන්සේව විශ්වාස කරන අය 100% ක්ම පරිපූර්ණ අවංකත්වයෙන් කටයුතු කරයි. එවිට අනික් අයව කපටිකමෙන් මුළා කිරීමට හෝ රැවට්ටීමට නොහැකිවේ. අපි යහපත් දේවල් කරනවා නම් කවුරු බලාගෙන සිටියේ නැති වුනත්, කවුරු දැනගෙන සිටියේ නැති වුනත්, සියළු බුදුවරුන් හා සියළු දෙවිදේවතාවුන් බලාගෙන සිටියි. එබැවින් අපගේ කැපවීමට වටිනාකමක් ලැබෙන නිසා සියළුදෙයම බුදුන් වහන්සේට භාරදී, දෙඩියාවෙන් තොරව ස්ථිර හදවතින් කටයුතු කිරීමට හැකිවේ.

මේ දක්වා මම ගතකළ ජීවිතය ගැන නැවත හැරී බැදීමේදීද, බුදුන් වහන්සේ ගැන පොඩි හෝ සැකයක් නැතිව, සම්පූර්ණ විශ්වාසයෙන් මේ දක්වා කටයුතු කිරීමට හැකිවීම මා ලැබූ ඉමහත් සතුටකි. ඒ පිහිටෙන් හමුවෙන සෑම පුද්ගලයෙකුවම බියක් නොමැතිව විශ්වාස කිරීමට හැකි වුනි.

*Kaiso zuikan* 9 පි. 190-191

Living the Lotus
Vol. 161(February 2019)

Senior Editor: Koichi Saito
Editor: Eriko Kanao
Copy Editor: P.A.D. Somapala,
G.N. Ruklanthi, Sahan Chamara

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලී සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.



# අන්‍යයන්ට සැලකීම චිත්තතියක් කරගන්න

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## ආශාවන් තුලින් ආනිශංස ලැබේ

ප්‍රසිද්ධ ස්ථානයක අපහසුතාවයට පත්වී සිටින කෙනෙකු දුටුවොත්, ඔබ කරන්නේ කුමක්ද? බොහෝ දෙනා එම තැනැත්තා වෙත ගොස් කථාබහ කරයි යැයි සිතමි. එහෙත් සමහරු අපහසුතාවයට පත්වූ තැනැත්තා ගැන සැලකිළිමත් වූවත්, සවිස්තරව සොයාබැලීම අනවශ්‍යය යැයි සිතා, සමීපයට යාමට පසුබට වෙති.

නිශ්චිතවම කිව නොහැකි වුවත්, අප බොහෝ විට තීරණ වලට එලඹෙන්නේ එයින් ලද හැකි වාසිය හෝ අවාසිය විමසා බැලීමෙන් නිසා, වාසියක් නොලැබෙන දේ ගැන සිතීමට උදාසීන වේ. එබැවින් බොහෝ දෙනාට තම හදවතේ ආශාවන් මැඩ පවත්වා ගැනිමට අපහසුය.

අනවශ්‍ය ප්‍රශ්න ඇතිවේ යැයි හැඟීමත් තිබෙන නිසා, නාඳුනන පුද්ගලයන් සමඟ කථාබහ කිරීම එක් වදනකින් හෝ කිසිදු වාසියක් සිදු නොවේ යැයි සිතයි. සත්‍යය වශයෙන්ම වාසියක් සිදු නොවන්නේද?

එක් වදනකින් හෝ කිසිදු වාසියක් සිදු නොවේ යැයි සිතුවත්, අන්‍යයන්ට සැලකීමේ චිත්තතියේ (හදවතේ පුරුද්ද) පුහුණුව තුලින් ලැබෙන ආනිශංස ලෙස, මානුෂීය ගුණයෙන් දියුණු වූ හදවතක් වෙත ළඟා විය හැකිය. මනුෂ්‍යයයෙකු ලෙස දියුණුවක් ඇතිකර ගත යුතුය යන ආශාවේ ප්‍රාර්ථනය තුලින්, මානුෂීය ගති වලින් උසස් බවකට යා කරන 'ආනිශංස' ලැබේ. එබැවින්, 'ආශාවන්' තුලින් 'ආනිශංස' ලැබෙන බව පැවසිය හැකිය.

අපට මෙම කරුණ අවබෝධ වූවත්, අපහසුතාවයකට පත් වූ පුද්ගලයෙකු දුටු විට 'කුමක් හෝ කළ යුතුයි' යන හැඟීමෙන් ඉක්මණින් ක්‍රියාකාරී වීමට අවශ්‍ය ධෛර්යය නොමැති අයද සිටියි.

විවිධාර්ත සූත්‍රයේ 'ධර්ම දේශනාව' නම් වූ දෙවන පරිච්ඡේදයේ මෙසේ සඳහන් වේ. ''බෝධිසත්ව මහාසත්වයන් යලි යලිත් සියළු සංස්කාර ධර්මයන් පිළිබඳ මෙනෙහි කරමින්, සියළු සත්වයන් කෙරෙහි අපරිමිත මෛත්‍රියෙන් හා කරුණාවෙන් යුතුව, ඔවුන්ව දුකින් මුදවාලන්නට වෙහෙසෙන්නාහ.''

මෙයින් අපට උගන්වනු ලබන්නේ බෝධිසත්වයන් ලෙස, 'අප ඉදිරියේ සිටින ජනී ජනයා දෙස මෛත්‍රියෙන් හා කරුණාවෙන් යුතුව ''දුකින් මුදවාලීමට කටයුතු කරමු'' ලෙස අධිෂ්ඨාන කළ යුතු බවය.' ඒ සඳහා ''මායාවෙන් හා රාගයෙන් තොරවී, සෑම සියළුදෙයකම යථාර්තය

අවබෝධ කරගත හැකි වන පරිදි අධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම අත්‍යාවශයය.''ලෙස සදහන් කර ඇත.

වෙනත් අයුරකින් පවසනවා නම්, වාසිය හා අවාසිය මත තීරණ ගැනීමෙන් ඉවත්විය නොහැකිව සිටින අපට පවා, ආධ්‍යාත්මික දියුණුව තුලින් වාසිය පතාම කටයුතු කිරීමේ හැගීමෙන් මිදීමට හැකිය. එය චිත්තතියක් (හදවතේ පුරුද්දක්) බවට පත් වු විට, ඕනෑම වෙලාවක වාසිය හෝ අවාසිය ගැන නොතකා, අන්‍යයන්ට සැලකීම ස්වභාවයෙන්ම ක්‍රියාවට නැංවිය හැකිවේ.

## සියළුදෙයකම පදනම එකක්ය

'හිම පතනයත් සමඟම, මට ශීතලයි, මට ශීතලයි යන හදවතේ හඬ ඇසී, යන්නීය මාතාව, තබන්නට කුඩයක්, සිය මළ දරුවාගේ සොහොන මත'. තමාගේ මියගිය දරුවා ගැන මවකට දැනෙන හදපාරන ශෝකය මෙම කවියෙන් තියුණු ලෙස ප්‍රකාශ කරයි. ඒ වාගේම බෝධිසත්වයන් තුල පවතින අන්‍යයන් ගැන සිතීමේ හැගීමත් මෙම මවට සමාන යැයි හැගෙයි.

මෙම මව නිතරම හදවතින් හා මනසින් මියගිය දරුවා සමඟ බද්ධ වී ජීවත්වේ. මට ශීතලයි, මට ශීතලයි ලෙස දරුවා විලාප නඟනවා යැයි සිතමින්, මනසේ ඇතිවන හැගීම, ඒ ආකාරයට ක්‍රියාවට නැංවුවා යැයි සිතමි. එම ක්‍රියාව බෝධිසත්වරයෙකුගේ මෛත්‍රිය හා කරුණාව ලෙස දකින්නේ මම පමණක් නොවේ යැයි සිතමි.

ඉහත සදහන් කළ ආකාරයට ''මායාවෙන් හා රාගයෙන් තොරවී, සෑම සියළුදෙයකම යථාර්තය අවබෝධ කරගත හැකි වන පරිදි අධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම අත්‍යාවශයය.'' ලෙස පැවසීමේ අරුථ මෙම මව මෙන්, තමා හා අන්‍යයන්ගේ පදනම එකක් ලෙස කල්පනා කල යුතු බවයි. තවද සියළු දෙයකම පදනම එකක් ලෙස දකින විට අන්‍යයන්ගේ සතුට හා දුක හොදින් ග්‍රහණය කර ගත හැකිවේ. ඒ තුලින් මෛත්‍රියේ හා කරුණාවේ හදවත උද්දීපනය වී, අන්‍යයන් ගැන සිතීමේ හැගීම ක්‍රියාවට නැංවිය හැකිවේ. 'සියළු දෙයකම පදනම එකක්' යන දැක්ම තුලින් අන්‍යයන් ගැන සිතීමේ 'චිත්තතියක්' (හදවතේ පුරුද්දක්) ඇතිවේ.

කලකට ඉහතදී, නිර්මාතෘ තුමාගේ උපන් ගම වන නීගත ප්‍රදේශයේ තෝකමචි ගමට ගිය අවස්ථාවක, නිර්මාතෘ තුමාගේ උඩුකය ප්‍රතිමාවක් තැන්පත් කර තිබුණු ප්‍රසිද්ධ උද්‍යානයකට මහ වැසි වැටෙමින් තිබුණි. එවිට සැනෙකින් මාගේ පියාගේ ප්‍රතිමාවේ හිසට මම කුඩයක් ඇල්ලු බව මතකයට නැගේ. මමත් ස්වභාවයෙන්ම ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙකු ගැන සිතීමට හැකි පුද්ගලයෙකු ලෙස පත්වීමට හැකි අයුරින් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට බලාපොරොත්තු වෙමි.

ෂිදෝ බුනන් නම් සෙන් ගුරුතුමා විසින් 'ස්වභාවයෙන්ම මෛත්‍රිය හා කරුණාව දැක්වීමට හැකිනම්, ඔබ බුදු කෙනෙකු වේ' ලෙස කියාදෙයි. අන්‍යයන් සමඟ එකට බද්ධ වී, මෛත්‍රිය පූර්වකව කටයුතු කරන බව නොදැන, අන්‍යයන්ට කාරුණිකව සලකන විට, ඔබගේත් අන්‍යයන්ගේත් සතුටට හා හදවතේ සංවර්ධනයට මඟ පෑදෙන්නේය.

From Kosei, February 2019.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය

## 4 වන පරිච්ඡේදය, විශ්වාසය හා අවබෝධය (2)

### කොපමණ බුදුන් වහන්සේට පිටුපෑවත්

මෙම උපමා කතාවේ සදහන් පරිදි සිටුතුමා වන්නේ බුදුන් වහන්සේය, දිළිඳු දරුවන් වන්නේ සියළු සත්වයන් වන අපි වේ. අපි සියළුදෙනාම බුදුන් වහන්සේගේ දරුවන් වූවද, එම කරුණ අවබෝධ කර නොගන්නා නිසා බුදුන් වහන්සේට පිටුපාමින් දුකින් පිරි ලෝකයේ රස්තියාදු වෙමින් ඇවිද යයි. බුදුන් වහන්සේ හා අපගේ තිබෙන බැදීම ඉතා ශක්තිමත් නිසා, 'බුද්ධ ශක්තිය තිබෙන' බුදුන් ගේ දරුවෙකු බව අවබෝධ නොකරගෙන ගෙන අප සවාරියේ ගියද, කවද හෝ බුදුන් වහන්සේ වැඩ සිටින දිශාවට ළඟා වේ. එසේ වන්නේ මනුෂ්‍යයන්ගේ පදනම 'බුද්ධ ශක්තියෙන්' සෑදී තිබෙන බැවිනි. එය වචන වලින් පැවසිය නොහැකි තරම් විශිෂ්ඨය.

සියළු සත්වයන් ලෙස අප මාළිගයේ ඉදිරිපිට සිටගෙන සිටියත්, බුදුන් වහන්සේ අපගේ පියා යැයි නොදනියි. නමුත් බුදුන් වහන්සේ, අර සිටින්නේ මාගේ දරුවන් යැයි හොදින් අවබෝධ කර ගෙන සිටියි. එය ඉතාමත් ගැඹුරු කරුණකි. එනම්, විශ්වයේ මහා ජීව ශක්තිය වන සදතනික බුදුන් වහන්සේ, නිතරම අපගේ හදවත හා ශරීරය තුල ගැබ්වී තිබුනත් අපට නොදැනෙයි. සදතනික බුදුන් වහන්සේ විසින් අපට එම කරුණ දැනෙන තෙක් බලාගෙන සිටියි.

### තම බුද්ධ ශක්තිය ගැන නොදන්නා සියළු සත්වයින්

මානුෂීය ස්වරූපයකින් ශාඛ්‍යමුණි බුදුන් වහන්සේ මෙලොවට පහලව, සදතනික බුදුන් හා සියළුම සත්වයින්ගේ පදනම එකට බැදී තිබෙන බව සත්‍යාවබෝධ කර ගත්හ. නමුත් එම කරුණ ඉතා ගැඹුරු නිසා, සියළු සත්වයින් විසින් - අපි වාගේ සාමාන්‍ය මනුෂ්‍යයන්ට එම තත්වයට ළඟා වීමට නොහැකියි- ලෙස හීනමානය තුලින් බිය වි, ධර්මයේ දොරටුව ඉදිරියට පැමිණ පලායයි.

එවිට බුදුරජාණන් වහන්සේ උපාය කෞෂල්‍යය භාවිතා කර, දිළිඳු දරුවාගේ ස්වරූපයට සමානකමක් තිබෙන නමුත්, ටිකක් උසස් මෙහෙකරුවන් දෙදෙනෙකු පිටත් කර යැවුහ. එම මෙහෙකරුවන් මාළිගයේ සේවය කරමින් සිටියත් මානසික ස්ථාවරත්වය ඇතිකර ගෙන ශ්‍රාවක හා ප්‍රත්‍යයක බුද්ධ තත්වයට පත් වී සිටින දෙපලකි. දිළිඳු දරුවාට -මේ දෙදෙනා සමඟ නම් මිත්‍ර වීමට හැකියි- යන හැගීම ඇති කර, මාලිගයේ වැඩට ගෙන්වා ගත්හ. මේ ආකාරයට කටයුතු කිරීම යනු, බුදුන් වහන්සේ කොයිම වේලාවකවත් අපව මඟ හැරීමට නොදී, කුමක් හෝ කර තමා විසින්ම තම බුද්ධ ශක්තිය අවබෝධ කර ගන්නා ආකාරයට නොයෙකුත් ක්‍රියාමාර්ග භාවිතා කරමින් කටයුතු කරයි.

### පහළ අදියරයන් වුවද ඉතා වැදගත්ය

දිළිඳු දරුවාව මාළිගයට රැගෙන විත් පිරිසිදු කිරීමේ කටයුතු භාරදුනි. එය, හදවතේ තිබෙන මංමුලාවීම් වලින් මිදීමට ලබා දුන් ධර්ම පුහුණුවකි. බුදුන් වහන්සේ විසින් ඒ ආකාරයේ පුහුණුවීම් ලබාදී, ටිකෙන් ටික ධර්මයට සමීප කිරීම තුලින් 'ඔබව මාගේ දරුවෙකු කරගන්නෙමි' යැයි පවසා, බුදුන් වහන්සේ හා සමාන ධර්මාවබෝධය ලබා දීමට කටයුතු කරයි. ඒත් අපි, ධර්මාවබෝධය අපට අදල නැතැයි සිතමින්, එය වැරදි අදියරක් සේ සිතමින්, ඊටත් වඩා පහල තත්වයක හුරතල් වෙමින් දීර්ඝ කාලයක් ටිකෙන් ටික ධර්ම පුහුණුවේ යෙදී සිටිනවා වේ. නමුදු, එයත් බැහැර නොකල යුතු වැදගත් කරුණකි. සත්‍යාවබෝධය ලැබ බුදුන් වහන්සේ හා සමාන තත්වයට පත්වීමේ හැකියාව ඒ ආකාරයේ දීර්ඝ කාලීන පුහුණුව තුලින් ලැබෙන්නකි.



එසේ කටයුතු කිරීම තුලින්, සියළු සත්වයන්ද ධර්මයේ පුළුල් අවබෝධය තුලින් ටිකෙන් ටික හදවතේ ස්වාධීනත්වයට පත් වීමට හැකිවේ. එවිට මෙහෙකරුවන් එකතුව ධර්මයේ භාරකාරීත්වය සම්පූර්ණයෙන්ම භාරදෙයි.

නමුත්, අප බුදුන් වහන්සේගේ ධර්මය අන්‍යයන්ට කියාදීමේ වැදගත්ම රාජකාරිය කලා වූවත්, තමන් බුදුන් වහන්සේගේ දරුවෙකැයි සිහිනෙන්වත් නොසිතයි. තමාගේ පදනම බුදුන් වහන්සේ හා සමාන බව නොදැන, බුදුන් හා තමන් හාත්පසින්ම වෙනස් යැයි සීමාවන් වෙන් කරයි.

## තම බුද්ධ ශක්තියට දැස් විවර කර ගැනීම


බුදුන් වහන්සේ පරිණිර්වානයට පෙර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කර, 'බුදුන් හා සියළු සත්වයන් යනු එකිනෙකට වෙන්වූ පිරිසක් නොව, එකට බැදී සිටින දෙමාපිය දරුවන් සේය. එබැවින් බුදුන් වහන්සේගේ සියළුම සම්පත් වලට උරුමකම් කියයි. එනම්, සෑම සියළු පුද්ගලයෙකුම බුදුන් හා සමාන තත්වයට පත්වීමට හැකිය' ලෙස ප්‍රකාශ කලහ.

එවිට ප්‍රථම වතාවට සියළු සත්වයන්ද බුදුන් වහන්සේ දේශනා කළ ධර්මයේ යථාර්තය අවබෝධ කරගෙන, නොසිතන ආකාරයේ සම්පත් (සත්‍යාවබෝධය) තමාගේ කරගත හැකිබව අවබෝධ වී, ඉමහත් සතුටට පත්විය.

## තම ජීවන හරයේ වටිනාකම දැනගන්න

මෙම උපමා කතාවේ සදහන් අරුත එක් වාක්‍යකින් පවසනවා නම්, 'තමා මංමුලා වු මනුෂ්‍යයෙකි, පාපයන්ගෙන් පිරී ඇත යන හීනමානය දුරුකර, බුදුන් වහන්සේගේ දරුවෙක් යන යථාර්තයට දැස් විවර කරගනිමු' යන්නයි. එනම්, 'තම ජීවන හරයේ උදාරත්වය සොයා ගැනීම' වේ.

ඒ ආකාරයට දැස් විවර කරගන්නේ නම්, එලක් නැති දේ කිරීමට නොහැකි වේ. උදාහරණයක් ලෙස, තෘෂ්ණාවක් ඇති වුවත්, එයට මුලා වී වැරදි කිරීමට හෝ දුකට පත්වීමක් නැති වන්නේය. ආශාවන් ඇති වූවත් ඉබේම එය වෙනත් කටයුත්තකට භාවිතා කිරීමට පත්වන්නේය. ඒ තුලින් දුකින් මිදීමට හැකි වන්නේය.



මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P63-P68)

# අන්‍යයන් ගැන සිතීමේ පුරුද්ද

'අධික සීත කාලයේ සූත්‍ර සජ්ඣායනය' මේ දින වල තිබෙන බැවින්, එයට සහභාගි වන පිරිසද විශාලය. එසේම අධික සීත කාල සූත්‍ර සජ්ඣායනයෙන් පසුයි නියමාකාරයෙන් නව වසර ආරම්භවන්නේ, ලෙස සිතන පිරිස්ද සිටියි.

මේ වසරේ නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩ තුල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කොටස් වල අරුථ පැහැදිලි කරමින් දේශනා කරයි. පෙබරවාරි මාසයේදී, විවිධාර්ථ සූත්‍ර යේ, ධර්ම දේශනාව යන 2 පරිච්ඡේදයේ  වැකියක් ගෙන හැර දක්වයි. ''බෝධිසත්ව මහාසත්වයන් යලි යලිත් සියළු සංස්බාර ධර්මයන් පිළිබඳ මෙනෙහි කරමින්, සියළු සත්වයන් කෙරෙහි අපරිමිත මෛත්‍රියෙන් හා කරුණාවෙන් යුතුව, ඔවුන්ව දුකින් මුදවාලන්නට වෙහෙසෙන්නාහ.'' ඒ තුලින් 'අප ඉදිරියේ සිටින ජනී ජනයා දෙස මෛත්‍රියෙන් හා කරුණාවෙන් යුතුව ''දුකින් මුදවාලීමට කටයුතු කරමු'' ලෙස අධිෂ්ඨාන කළ යුතු බව' බෝධිසත්වයන්ට දේශනා කරයි.

එවැනි හදවතකට පත්වීමට නම්, දරුවන් වෙනුවෙන් කොන්දේසි විරහිතව කටයුතු කරන මවක් සේ 'සෑම දෙයකම පදනම එකක්', යන දැක්ම තුලින් 'අන්‍යයන් ගැන සිතීමේ' පුරුද්ද ඇති කර ගත යුතුවේ.

මේ මාසයේදී අන්‍යයන් ගැන ස්වභාවයෙන්ම සිතෙන පරිදි කටයුතු කළ හැකි ආකාරයට ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට මමත් අරමුණු කරමි.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp